ලේනා වූ කලී දරුවන්ගේ සුන්දර ළමා ලෝකය ප්‍රීතිමත් කරන සුරතලෙකි. ගෙවත්තේ අඹ ගසේ හෝ ජම්බු ගසේ එහා මෙහා පනිමින්, වලිගය උස්සා දිව යන අයුරු දරුවාගේ සිතට ප්‍රීතියක් ඇති කරවයි. කුමාරතුංග මුනිදාස මහතාණන් අතින් ලියවුණ

"ලේනේ ඔබ පා නිදහස
ටිං ටිං ගාමින් මේ ලෙස
බුදිමින් හොඳ හොඳ පල රස
සිටිනු දකින මට වෙයි තොස"

වැනි කවියක් ගෙන බැලීමේදී වුවද ලේනා හා කුඩා දරුවා අතර ඇති මිහිරි සබැඳියාව හඳුනාගත හැකිය. එස්. මහින්ද හිමියන්ගේ ළමා පැදි අතර ද ඒ ආකාරයෙන් ලියවුණ රසවත් නිර්මාණ වෙයි.

"සුරතල් පානා
කෝ මගෙ ලේනා
වලිගේ උස්සා
මෙතැනින් බැස්සා"

මේ අයුරින් දරුවන් ප්‍රිය කරන කුඩා වන සතුන්ගේ හා වෙනත් සුරතල් සතුන්ගේ ගමන බිමන, කෑම බීම, නාද කිරීම මෙන්ම විවිධ වර්ණ හා හැඩ ඇති පෙනුම ද ඉස්මතු කරමින් ජීවමාන සතුන් කුඩා දරුවන්ගේ මනසෙහි සිතුවම් කරන්නට මෙම කතු හිමියන් යොමු වී ඇත්තේ ළමා මනස පිළිබඳ මනා අවබෝධයකින් යුතුවය.

කුඩා දරුවන්, විශේෂයෙන්ම එදා සමාජයේ දරු-වන් හැදුණේ, වැඩුණේ මූලික වශයෙන් දෙමාපිය රැකවරණය යටතේ වුවද සිය නිවසේම හෝ අන් තැනක විසූ සමීප නෑ හිතවතු-න් ද ඔවුන්ගේ ජීවිතයට අතිශයින් සම්බන්ධ අය බව පැහැදිලිය. දරුවන්ගේ ජීවිතයට සමීප එබඳු පුද්ගලයන් තම ළමා කවිවලින් නිරූපණය කරන මහින්ද හිමියන් එමගින් දරුවන් තුළ රස ජනනය කරන්නට උත්සාහ ගෙන ඇති ආකාරය ද පැහැදිලිවම දැකගත හැකිය.

"ආතාගේ
රැවුල දිගයි
කිරි වාගේ
සුදුම සුදුයි
මගෙ ආතා
මා වඩලා
නළවන්නේ
දොයි කියලා"

පෙරදිග සංස්කෘතික පරිසරය තුළ දරුවන්ට තම දෙමාපිය දෙපාර්ශ්වයේ වැඩිහිටි ඥාතීන්ගේ ආදරය හා ආරක්ෂාව සැලසෙන අයුරු සිංහල සමාජයෙන් ද ප්‍රකට වන්නකි. බොහෝ විට තමන් සමග එක නිව-සේම ජීවත් වන මුත්තණුවන් තමා නළවා නිදි කොට වැඩූ ආකාරය සිහි කරවමින් ආතා කෙරෙහි දරුවා තුළ ඇති ඇල්ම තවත් වැඩිදියුණු කරවීමට ද මෙබඳු පද්‍ය රචනා ප්‍රයෝජනවත් වනු ඇත. සිංහල සමාජය තුළ බාලයන් හා වැඩිහිටියන් අතර අන්‍යෝන්‍ය ආදරය මෙන්ම වැඩිහිටියන්ට සැලකීම වැනි ගු-ණාංග වර්ධනය කරලීමට ළමා පද්‍ය සඳහා මෙවන් වස්තු විෂය කරගැනීම මහින්ද හිමියන්ගේ කාර්යය සඵල වීමට තුඩු දුන් කරුණකි.

මිනිස් සබඳතා මෙන්ම, සතුන් කෙරෙහි ආදරය ද, එපමණක් නොව පරිසරයෙහි සැබෑ සුන්දරත්වය ද දරුවාගේ සිතට දැනෙන පරිද්දෙන් වර්ණනා කිරීමට මහින්ද හිමියන් දැරූ තැත සැබවින්ම ප්‍රශංසනීයයි.

"සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට"

දරුවන්ගේ සිතුම් පැතුම්වලට පමණක් නොව ඔවුන් වහරන බසට ද සමීපව යමින් මහින්ද හිමියන් කළ මෙවන් නිර්මාණ ළමා ලෝකය ප්‍රීතිමත් ලොවක් කරන්නට දැරූ උත්සාහයකි. කවියක යොදාගත හැකි උචිත උපමා රූපක ද ගළපාගනිමින් මෙබඳු සරල සුන්දර ළමා කවි කොතෙකුත් මෙම ලේඛකයා අතින් නිර්මාණය වී ඇත. මේ හැරුණ විට මහින්ද හිමියන් අතින් ලියවුණ, 'මල් උයන', 'වලාකුළ', 'ගංගාවක්', 'සැන්දෑව', 'වැස්සට පළමු', 'ළමයා සහ තාරකා' යනාදී මාතෘකා යටතේ රචනා වූ ළමා පද්‍ය රාශියක්ම ඇත. දරුවන්ගේ ලෝකයට පිවිස එහි සුන්දරත්වය තමන් ද විඳගනිමින් දරුවන්ගේ මනස වඩාත් ප්‍රීතිමත් කරවන්නට මහින්ද හිමියන් කළ ළමා රචනා එදාට පමණක් නොව අදටත්, මතුවටත්, ළමා සාහිත්‍යයේ අගනා නිර්මාණ ලෙස වැදගත් වනු ඇත.

**THE CONSULATE GENERAL OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

Suite 536, No. 1 Queens Road, Melbourne, VIC 3004, AUSTRALIA

Telephone : 92904200
Fax : 98674873

web site: www@slcgmel.org
email : mail@slcgmel.org

**Recognition of the Top 10 VCE High Achievers of Sri Lankan origin at the Commemoration of the 67th Anniversary of the Independence of Sri Lanka**

The Consulate General of Sri Lanka in Victoria requests nominations of those who have achieved ATAR score of 90 or above from the 2014 VCE examination to be considered for the top 10 VCE High Achievers Awards.

The awards will be presented at the Commemoration of the 67th Anniversary of the Independence of Sri Lanka to be held on the 4th of February 2015 at 'The Grand' at Cathies Lane, Wantirna South.

To obtain a nomination form and for further details, please call **0434 624 191** or **0409 077 420** or send an email to mail@slcgmel.org.

Duly completed nomination forms should be received by the Consulate General by **5.00pm on Thursday the 15th of January 2015**.

ශ්‍රී ලංකාවේ 67 වෙනි නිදහස් සමරු උළෙලේ දී **VCE** විභාගයෙන් උපරිම සමත්කම් දැක්වූ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති සිසුන් 10 දෙනා පිළිගැනීමට ලක් කිරීම

වික්ටෝරියාවේ කොන්සල් ජෙනරාල් කාර්යාලය 2014 VCE විභාගයෙන් 90 ක් හෝ ඊට වැඩි ATAR ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති සිසුන් හට, VCE විභාගයෙන් උපරිම සමත්කම් දැක්වූ සිසුන් 10 දෙනා හට පිරිනැමෙන ප්‍රදානයන් සඳහා අයදුම් කරන මෙන් ඉල්ලා සිටී.

2015 පෙබරවාරි 4 වෙනිදා Wantirna South හි 'The Grand' හිදී පැවැත්වෙන ශ්‍රී ලංකාවේ 67 වෙනි නිදහස් සමරු උළෙලේදී මෙම ප්‍රදානයන් පිරිනැමෙනු ඇත.

අයදුම්පත් හෝ වැඩි විස්තර ලබාගැනීම සඳහා අමතන්න 0434 624 191 හෝ 0409 077 420 නැතහොත්, mail@slcgmel.org වෙත විද්‍යුත් ලිපියක් යොමු කරන්න.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජනවාරි 15 වෙනි බ්‍රහස්පතින්දා ප.ව. 5 ට පෙර කොන්සල් ජෙනරාල් කාර්යාලය වෙත ලැබීමට සලස්වන්න.


IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



We Deliver Results...